# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1698/20 - 2011 මාර්තු 24 වැනි බ්‍රහස්පතින්දා - 2011.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### නැගෙනහිර පළාතේ පළාත් සභාව

2010 වර්ෂයේ අංක 01 දරන නැගෙනහිර පළාත්
පෙර පාසල් අධ්‍යාපන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නැගෙනහිර පළාතේ පළාත් සභාව මගින් 2010.02.09 වැනි දින සභා සම්මත කොට, 2010.05.04 වැනි දින නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරන ලද්දාවූ ඉහත ප්‍රඥප්තිය සියලු දෙනාගේම දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන්,
ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන පුනරුත්ථාපන,
නැවත පදිංචි කිරීම, ග්‍රාම සංවර්ධන, මිනිස්බල, නීතිය හා සාමය,
පළාත් පරිපාලනය, සංචාරක හා පරිසර අමාත්‍යාංශය,
නැගෙනහිර පළාත් සභාව.

2011 මාර්තු මස 23 වැනි දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලය,
නැගෙනහිර පළාත,
ඇතුළු වරාය පාර,
ත්‍රිකුණාමලය.

**නැගෙනහිර පළාතේ පළාත් සභාවේ**
**2010 වර්ෂයේ අංක 01 දරන**
**පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශ ප්‍රඥප්තිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ ප්‍රතිඵලයක් වශයෙන් පළාත් සභාවලට පැවරී ඇති බලතලවලට අනුකූලව, නැගෙනහිර පළතේ මායිම ඇතුළත කලින් ස්ථාපනය කර ක්‍රියාත්මක කරනු ලබන හා අනෙකුත් අමාත්‍යාංශ ස්ථාපනය කරනු ලබන පෙර පාසල් අධීක්ෂණය කිරීම හා පරිපාලනය ඒකාබද්ධ කරනු ලබන අනිකුත් මෙහෙයුම් කටයුතු සඳහා පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශයක් ස්ථාපනය කිරීම, පාසල් ලියාපදිංචි කිරීම, ගුරුවරුන් හා ගුරුවරියන් ලියාපදිංචි කිරීම, පෙර පාසල් උපදේශක කමිටුවක් ස්ථාපනය කිරීම හා අනෙකුත් පෙර පාසල් ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳ ප්‍රතිපත්ති කමිටුවක් ස්ථාපනය කිරීම යනාදිය පිළිබඳව සංවිධානය කිරීමටත් ඊට අනුශාංගික විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තිය.

1A - PG 001229 —333 (2011/03)

පැනවීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නැගෙනහිර පළාතේ පළාත් සභාව විසින් පහත සඳහන් පරිදි පනවනු ලැබේ.

ලුහුඩු නාමය හා ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය 2010 වර්ෂයේ අංක 01 දරන නැගෙනහිර පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශ ප්‍රඥප්තිය යනුවෙන් හැඳුන්වනු ලබන අතර නැගෙනහිර ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන එවැනි දිනක සිට ක්‍රියාත්මක විය යුතුය.

## I කොටස

### අරමුණ

අරමුණු

2. (1) (අ) මෙම ප්‍රඥප්තිය ප්‍රතිපාදනයේ අවශ්‍යතාවයට අනුව පහත සඳහන් දේ මෙහි අරමුණු විය යුතුය,

(i) පළාත් පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශයක් ස්ථාපනය කිරීම ;

(ii) පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳව පළාත් උපදේශක කමිටුවක් ස්ථාපනය කිරීම ;

(iii) පළාත් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීමේ අරමුණ සඳහා කමිටුවක් ස්ථාපනය කිරීම ;

(iv) පළාතේ ක්‍රියාත්මක වන පෙර පාසල් ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, ඒකාබද්ධ කිරීම හා මෙහෙයුම් කිරීම

ලියාපදිංචි කළ පාසල්වල අරමුණු

(ආ) මෙම ප්‍රඥප්ති ප්‍රතිපාදනය යටතේ ලියාපදිංචි කළ පෙර පාසල්වල අරමුණු වශයෙන් පහත සඳහන් කරුණුවලින් සමන්විත විය යුතුය.

(i) ළමාවියේ වර්ධනය හා අදාළ මඟ පෙන්වීම ලබා දීම ;

(ii) ඉන්ද්‍රියන් ඇසුරින් අත්දැකීම් ලබා ගැනීම සඳහා හිතකර සාරවත් ආරක්ෂා සහිත පරිසරයක් ඇති කිරීම ;

(iii) දෛනික ක්‍රියාකාරකම් තුළින් ආචාරශීලී හැසිරීම් ලබා දීම ;

(iv) මිත්‍රශීලී සංවාදය, ආදරය හා සම්බන්ධතා කෙරෙහි තමාව හුරු කිරීමට පුහුණුව ලබා දීම ;

(v) මනා සෞඛ්‍යය පුරුදු, හුරුකර ගැනීමට මඟ පෙන්වීම හා ඊට සුදුසු පරිසරය පාසල් භූමියේ සැලැස්වීම ;

(vi) යහගුණ වැඩිකර ගැනීමට සුදුසු පරිසරයක් ඇති කර දීම ;

(vii) ශාරීරික වර්ධනය හා මනා ශරීර සෞඛ්‍යය වැඩි දියුණුව සඳහා අවස්ථාව සැලැස්වීම ;

(viii) ළමුන්ගේ ස්වයං හැකියාවන් හැඳුනාගෙන ඒවා බුද්ධිමය නිර්මාණශීලි හැකියා සංවර්ධනය කිරීම හා ඊට සුදුසු පරිසරය ඇතිකර දීම ;

(ix) පරිසරයට ආදරය කිරීම හා ඒතුළින් වින්දනය ලඟාකර සතුටුවීමට, පුහුණු කිරීමට හා පරිසරයේ වැදගත්කම දැන ගෙන එය ආරක්ෂා කිරීමට මඟ පෙන්වීම ;

(x) අභියෝගවලට මුහුණදීම සඳහා ශාරීරිකව හා මානසිකව හැකියාවන් සංවර්ධනය කිරීමට පුහුණු කිරීම ;

(xi) සමාජය සමඟ සහයෝගය ඇතිව කාර්යයන් ඉටුකිරීමට හුරුකළ හැකි හොඳ පරිසරයක් ඇති කිරීම ;

(xii) ළමුන්ගේ මුල් ළමාවිය විනෝදයෙන් හා සතුටින් ගත කිරීමට ඉඩදීම ;

(xiii) ළමුන්ගේ ඉදිරි අධ්‍යාපන සංවර්ධනය සඳහා ශක්තිමත් අත්තිවාරමක් සලසා දීම ;

(xiv) ප්‍රදේශ ජනතාවගේ භාෂාව, කලාව හා සංස්කෘතියේ අගයන් හා ඒවායේ වැදගත්කම ළමුන් අතර වටහා දී ජාතික හා අනෙකුත් ජාතීන්ගේ සමගි ආකල්පය වර්ධනය කිරීම ;

(xv) තොරතුරු තාක්ෂණය හා අනෙකුත් ඉංග්‍රීසි භාෂා යනාදිය සමඟ ළමුන්ට මිත්‍රශීලී හැඟීම් සැලැස්වීම.

## *II කොටස*

### *පරිපාලනය හා අධීක්ෂණය*

3. (1) නැගෙනහිර පළාත් පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශය (මින් මතුවට කාර්යාංශයක් යනුවෙන් හැඳුන්වනු ලබන) ස්ථාපිත කළ යුතුය. පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශයක් ස්ථාපනය කිරීම

(2) උප වගන්ති (1)න් නම් කරන ලද කාර්යාංශය ඒකාබද්ධ කරන ලද ස්ථිර, අඛණ්ඩ, පසු අයිතිය හා පොදු ලාංඡනයකින් සමන්විත විය යුතු වන අතර ඒ නමින් නඩු ගොනු කිරීමට හෝ නඩුවකට ඇතුළත් විය හැක.

4. (1) කාර්යාංශයේ පරිපාලනය කළමණාකරණය හා පාලනය යනාදිය මින් මතුවට ඇති කළ හැකි පරිදි පිහිටුවන ලද කළමණාකරන මණ්ඩලයකට පැවරිය යුතුය. කාර්යාංශයේ කළමනාකරණය

(2) කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය (මින් මතුවට "මණ්ඩලය" යනුවෙන් හැඳුන්වනු ලැබේ). එය පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය.

(අ) නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නියෝජිතයා ;

(ආ) නැගෙනහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ නියෝජිතයා ;

(ඇ) නැගෙනහිර පළාත් භාණ්ඩාගාරයේ නියෝජිතයා ;

(ඈ) උප වගන්ති (3) හා (4) ප්‍රතිපාදනවලට අනුව ඇමතිවරයා විසින් පත්කරනු ලබන වෙනත් හතර දෙනෙක්.

(3) (අ) උප වගන්ති (2) හි (ඈ) වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පත්කළ කවර සාමාරිකයෙකුගේ වුව ද පත්වීම ඔහු තමාගේ සම්පූර්ණ බලයෙන් ඉවත් කළ හැක.

(ආ) උප වගන්ති (2) හි (ඈ) වගන්තිය යටතේ පත් කරන ලද මණ්ඩලයේ සාමාරිකයන් කවරෙක් වුවද ඇමතිවරයාගේ ලිපිනයට ලියන ලද ලිපිය මගින් ඕනෑම අවස්ථාවක මණ්ඩලයෙන් ඉවත්විය හැක.

(ඇ) උප වගන්ති (2) හි (ඈ) වගන්තිය යටතේ පත් කළ සාමාජිකයෙක් මිය යෑමෙන් හෝ තනතුරෙන් අස්වීමෙන් හෝ තනතුරෙන් ඉවත් කිරීමෙන් මිස ඔහුගේ නිල කාලය අවුරුදු 3ක් විය යුතුය.

(ඈ) උප වගන්ති (2) හි (ඈ) වගන්තිය යටතේ පත් කළ සාමාජිකයෙකුගේ තනතුරෙන් ඇබෑර්තු ඇතිවේ නම් ඔහු වෙනුවට වෙනත් කෙනෙක් ඇමතිවරයා විසින් පත්කළ යුතු අතර එසේ පත් කරනු ලබන සාමාජිකයාගේ නිල කාලය ඇබෑර්තුව ඇති කළ සාමාජිකයාගේ නිල කාලයේ ඉතිරි කාලයක් සේ තිබිය යුතුය.

(4) (අ) උප වගන්ති (2) හි (ඈ) වගන්තිය යටතේ පත් කළ සාමාජිකයෙක් මණ්ඩලයේ සභාපතිවරයෙකු වශයෙන් ඇමතිවරයා විසින් පත්කළ යුතු අතර සභාපතිවරයා ද පෙර පාසල් අධ්‍යාපනය සඳහා වූ බලයලත් නිලධාරියෙකු විය යුතුය.

(ආ) අසනීපය හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර සිටීම වැනි හේතූන් මත බලයලත් නිලධාරියා තමාගේ රාජකාරිය ඉටු කිරීමට අපොහොසත්වීමේ දී, ඇමතිවරයා උපවගන්ති (2) හි වගන්ති (ඈ) යටතේ පත්කළ වෙනත් සාමාජිකයෙක් වැඩබලන සභාපතිවරයෙකු වශයෙන් පත් කළ යුතු අතර එම වැඩබලන සභාපති වැඩබලන බලයලත් නිලධාරියෙකු විය යුතුය.

(5) මණ්ඩලයේ කිසියම් රැස්වීමක් සඳහා ගණපූර්ණය සාමාජිකයන් 4 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(6) මණ්ඩලය එහි රැස්වීම සම්බන්ධවත් එවැනි රැස්වීම්වල කටයුතු මෙහෙයවීම පිළිබඳවත්, අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත විධිවිධාන මගින් පිළියෙළ කළ හැක.

(7) මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය හෝ එහි කටයුතු කිසිවක් සාමාජිකයන් අතර ඇබෑර්තු පවතින හේතුවෙන් හෝ සාමාජිකයෙකුගේ පත්වීමේ දී කිසියම් අඩුපාඩු පවතින හේතුවෙන් පමණක් වලංගු නොවන බව නොසැලකේ.

(8) අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවය ඇතිව ඇමතිවරයා විසින් තීරණය කරනු ලබන එවැනි වැටුපක් කාර්යාංශයේ අරමුදලින් වගන්ති 4හි උපවගන්තිය (2)(ඈ) යටතේ අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින්ට ගෙවීම් කළ හැක.

කාර්යාංශයේ බලතල

5. කාර්යාංශය නමින් මණ්ඩලය පහත සඳහන් බලතලවලින් යුක්ත විය යුතුය.

(අ) සංචල හෝ නිශ්චල දේපළ අත්පත් කර ගැනීම, දැරීම හෝ කළමනාකරණය කිරීම.

(ආ) කාර්යාංශයට හිමිකළ හැකි සංචල හෝ නිශ්චල දේපළ විකිණීම, උකස් කිරීම, ගනුදෙනු කිරීම හෝ වෙනත් අන්දමින් භාරදීම හෝ පරිහරණය කිරීම.

(ඇ) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමට අවශ්‍ය එවැනි ක්‍රියාවන් හා කාර්යයන් කිරීම.

කාර්යාංශ ගිණුම්

6. රජයට අර්ධ වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ හිමි කිසියම් බැංකුවක නැගෙනහිර පළාත් පෙර පාසල් අධ්‍යාපන කාර්යාංශ ගිණුමක් මණ්ඩලය නඩත්තු කළ යුතු අතර ප්‍රදානය හෝ පරිත්‍යාගය මාර්ගයෙන් හෝ වෙනත් මාර්ගයෙන් හෝ ළමා අධ්‍යාපන සංවර්ධනය තමාගේ පරමාර්ථය තුළ එකක් ලෙස සලකනු ලබන කිසියම් සංවිධානයකින් හෝ ලැබිය හැකි සියලු මුදල් එවැනි ගිණුමට බැර කළ යුතුය.

කාර්යාංශයේ මුදල් භාවිතා කළ හැකි අරමුණු

7. ඇමතිවරයාගේ උපදෙස් අනුව කාර්යාංශයට අයත් මුදල් කාර්යාංශයේ අරමුණු සඳහා උපයෝගි කිරීම මණ්ඩලයේ රාජකාරිය විය යුතුය.

කාර්යාංශයේ නිලධාරීන් හා සේවකයන්

8. ඇමතිවරයාගේ නියෝගය අනුව පහත සඳහන් කරුණු සඳහා මණ්ඩලයට බලය තිබිය යුතුයඃ-

(අ) කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීමටත්, කළමනාකරණය කිරීමටත් අවශ්‍ය වන වැඩි නිලධාරීන් හා සේවකයන් පත් කිරීම ;

(ආ) එසේ පත් කළ නිලධාරීන්ට හා සේවකයන්ට ගෙවීම් කිරීමට හැකි වැටුප් පිළිබඳව තීරණය කිරීම ;

(ඇ) එවැනි වැටුප් කාර්යාංශයේ කටයුතු පරිපාලනය කිරීමේ දී දරනු ලබන වියදම් කාර්යාංශයේ ආදායමෙන් ගෙවීම ;

9. (1) කාර්යාංශයේ ආදායම්, වියදම්, වත්කම් හා අනෙකුත් ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීම සඳහා මණ්ඩලය කටයුතු කළ යුතුය. විගණනය හා ගිණුම් කටයුතු

(2) කාර්යාංශයේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තිය අනුව නැගෙනහිර පළාත් සභාවේ විධි විධානවලට අනුව විගණනය කළ යුතුය.

10. විගණකාධිපතිවරයාගේ වාර්තාව ඇමතිවරයා විසින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. විගණකාධිපතිගේ වාර්තාව පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම

11. මණ්ඩලයේ බලතල වැඩ කටයුතු රාජකාරිය උපයෝගී කිරීම, ක්‍රියා කිරීම හා ඉටු කිරීම යනාදීන්ට බලපාන හෝ ඒ සම්බන්ධ හෝ ඊට සෘජුව බලපාන කිසියම් කාර්යන් පිළිබඳව මණ්ඩලයට අවශ්‍ය යැයි සැලකිය හැකි එවැනි විධිවිධාන ඇති කළ හැකිය. විධි විධාන ඇති කිරීම සඳහා මණ්ඩලයේ බලතල

12. කාර්යාංශයේ සියලු කළමණාකරනය මණ්ඩලයේ සාමාජිකයින්, නිලධාරීන් හා සේවකයන් ද අපරාධ දණ්ඩ නීති සංග්‍රහයේ අල්ලස් චෝදනා පනතේ අදහස් අනුව හා අරමුණු සඳහා ද රජයේ සේවකයන් ලෙස සැලකිය යුතුය. කාර්යාංශයේ සාමාජිකයින් නිලධාරීන් හා සේවකයන් අපරාධ දණ්ඩ නීති සංග්‍රහයේ අල්ලස් චෝදනා පනතේ අදහස්වලට අනුව රජයේ සේවකයෙකු ලෙස සැලකීම.

## *III කොටස*

### *උපදේශක කමිටුවක් ස්ථාපනය කිරීම*

13. (1) පෙර පාසල් අධ්‍යාපන උපදේශක කමිටුවක් (මින් මතුවට "උපදේශක කමිටුව" යනුවෙන් සඳහන් වේ) ඇමතිවරයා විසින් ස්ථාපනය කළ යුතුය. උපදේශක කමිටුවක් ස්ථාපනය කිරීම

(2) උපදේශක කමිටුව සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වන අතර 6 දෙනෙක් නිල වශයෙන් ද, 5 දෙනෙක් පත්කර ගැනීමෙන් ද සිදු කළ යුතුය.

(3) (අ) පහත සඳහන් 6 දෙනා ස්වකීය ධුරය මත නිල වශයෙන් සාමාජිකයන් ලෙස පත් වේ : නිල වශයෙන් සාමාජිකයන්

(i) නැගෙනහිර පළාතේ පෙර පාසල් භාරව සිටින අමාත්‍යාංශ ලේකම් ;

(ii) නැගෙනහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ;

(iii) නැගෙනහිර පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ ;

(iv) නැගෙනහිර පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ;

(v) නැගෙනහිර පළාත් ළමා පරිවාස, ළමා ආරක්ෂණ සේවා කොමසාරිස් ;

(vi) නැගෙනහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්.

(ආ) පහත සඳහන් 5 දෙනෙක් ඇමතිවරයා විසින් නියෝජිතයන් සාමාජිකයින් වශයෙන් පත් කරනු ලැබේ :- නියෝජිත සාමාජිකයින්

(i) පෙර පාසල් හා අනෙකුත් ළමා අධ්‍යාපනය පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වෙමින් පවතින ස්වේච්ඡා ආයතන නියෝජනය වන පරිදි දිස්ත්‍රික්ක තුනට එක් අයෙකු බැගින්,

(ii) පළාත් මට්ටමින් පෙර පාසල් අධ්‍යාපන ක්‍රමය පිළිබඳවත් ළමාවිය ක්‍රියාකාරකම් පිළිබඳවත් විශේෂඥතා දැනුම ඇති එක් අධ්‍යාපනඥයෙක් ;

(iii) ළමා වෛද්‍ය විශේෂඥයෙක් හෝ මානසික වෛද්‍ය විශේෂඥයෙක්.

උපදේශක කමිටු සභාපති, ලේකම් හා අනෙකුත් ක්‍රියාකාරකම්.

14. (1) උපදේශක කමිටු සභාපතිවරයා වශයෙන් පෙර පාසල් භාරව සිටින අමාත්‍යංශයේ ලේකම් කටයුතු කරන අතර, ලේකම් වශයෙන් පළාතේ පළාත් පාලන කොමසාරිස් කටයුතු කළ යුතුය.

(2) එක් උපදේශක කමිටු රැස්වීමක් සඳහා ගණ පූරණය, සාමාජිකයින් 5 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(3) පත් කළ සාමාරිකයෙකු මිය යෑමෙන්, කලින් තනතුරෙන් අස්වීමෙන් හෝ ඔහු ධූරයෙන් ඉවත් කිරීමෙන් මිස ඔහුගේ තනතුරේ නිල කාලය අවුරුදු 3ක් විය යුතුය.

(4) පත් කළ සාමාජිකයෙකු උපදේශක කමිටුවක් වශයෙන් සැලකිය හැකි කිසියම් රැස්වීමකට පෙර දැන්වීමකින් තොරව අඛණ්ඩව රැස්වීම් 3කට නොපැමිණියහොත් ඔහු තමන් විසින්ම තම සාමාජිකත්වය අතහැර ගියාසේ සැලකිය යුතුය.

(5) ඇමතිවරයාට ඕනෑම වේලාවක උපදේශක කමිටුවට පත්කර ඇති සාමාජිකයෙක් ධූරයෙන් ඉවත් කළ හැක.

(6) පත් කළ සාමාජිකයෙක් ඇමතිවරයාට ලිඛිතව දැනුම් දී තමාගේ සාමාජිකත්ව ධූරයෙන් ඉවත් විය හැක.

(7) පත් කළ සාමාජිකයෙක් මිය යෑමෙන් හෝ තනතුරෙන් ඉවත්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් හෝ වෙනත් කරුණක් නිසා තනතුර පුරප්පාඩු වන විට අදාළ පුරප්පාඩුවට සුදුසු වෙනත් අයෙකු ඇමතිවරයා විසින් වගන්ති 4 (3) (ආ) අනුව පත් කළ හැක.

කෙසේ වෙතත් එම ධූරයෙන් ඉවත්වූ සාමාජිකයා වෙනුවෙන් පත්කරනු ලබන සාමාජිකයා පුරප්පාඩු වූ එම සාමාජිකයාගේ ඉතිරි කාලයට පමණක් එම ධූරය දැරිය යුතුය.

(8) වගන්ති 13 හි උපවගන්ති (3) (ආ) හි යටතේ පත්කරනු ලබන සාමාජිකයින් එකිනෙකාට අමාත්‍ය මණ්ඩලයේ එකඟතාවය ඇතිව ඇමතිවරයා විසින් තීරණය කරනු ලබන එවැනි දීමනා කාර්යාංශයේ අරමුදලින් ගෙවීම් කළ හැක.

රැස්වීම් කාර්ය පරිපාටි සංග්‍රහය

(9) මෙම ප්‍රඥප්තියේ වෙනත් විධානයන් සලසා තිබුනොත් හැර උපදේශක කමිටුව තමාගේ ක්‍රියාකාරකම් හා වෙනත් රැස්වීම් පිළිබඳව කාර්ය පරිපාටියක් සකස් කළ යුතුය.

(10) උපදේශක කමිටුව අවම වශයෙන් මාස 3කට එක් වරක් රැස්විය යුතුය.

15. යම් තැනැත්තෙක්

උපදේශක කමිටුව සඳහා පත්කිරීමට සුදුසුකම් නොලත් අය පිළිබඳව

(1) (අ) ශ්‍රී ලංකා පුරවැසියෙක් නොවේ නම් හෝ ප්‍රජා අයිතිය නතර වුවහොත් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක බල පවත්නා යම් නීතියක් මගින් හෝ සිහිවිකල් බවට, ණය බේරීමට නොහැකි අය බවට හෝ ප්‍රකාශයට පත්කර ලැබ සිටිනම් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක අධිකරණයෙන් වරදකරුවෙකු ලෙස දක්නට ලැබුවහොත් ; හෝ

(ඈ) උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කාර්යයන් ඉටුකිරීමේ දී සාමාජිකයන්ගේ මුදල් හෝ වෙනත් අන්දමින් සම්බන්ධතාවය හෝ ක්‍රියාකාරකම් හෝ හානියක් සිදු කිරීමට තරම් බලපෑමක් ඇතිකරයි යැයි අදහස් කරන්නේ නම් ; හෝ

(ඉ) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදනවලින් ඕනෑම එකක් සම්බන්ධයෙන් වැරදිකරුවෙකු ලෙස පෙනී ගොස් ඇත්නම්, උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීමට නුසුදුස්සෙකු විය යුතුය.

16. උපදේශක කමිටුවේ ඇතිවන කිසියම් පුරප්පාඩුවක් හෝ සාමාජිකයෙකුව පත්කිරීමට ඇතිවන බාධාවන් කිසිවක් හෝ උපදේශක කමිටුවේ තීරණ කිසිවක් හෝ ක්‍රියාකාරකම් කිසිවක් හෝ අවලංගු කිරීමට නොහැකි විය යුතුය.

17. උපදේශක කමිටුව පහත සඳහන් කාර්යයන් හා වගකීම් ඉටුකිරීමට බැඳී සිටිය යුතුය. උපදේශක කමිටුවේ කාර්යයන් හා වගකීම්

(අ) පෙර පාසල් පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ වෙනස් කිරීම්, සංශෝධනය කිරීම් හෝ නව හඳුනා ගැනීම් ඉටුකිරීමේ දී ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වැඩ සටහන් පිළියෙළ කිරීම හා ඒවා ඇමතිවරයාගේ අවධානය සඳහා ඉදිරිපත් කිරීම ;

(ආ) පෙර පාසල් කටයුතු පිළිබඳව ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් තෝරා ගැනීම, ඒවා පිළිබඳ වැඩසටහනක් සකස් කිරීම, උපදෙස් ලබා දීම, සමාලෝචනය හා අධීක්ෂණය කිරීම ;

(ඇ) පළාත් සභා බල ප්‍රදේශය තුළ ලියාපදිංචි කළ පෙර පාසල්වල ක්‍රියාකාරකම් ඇගයීම හා අනෙකුත් පෙර පාසල් සඳහා වූ කරුණු පිළිබඳව විෂය නිර්දේශය තීරණය කිරීම, සමාලෝචනය හා වෙනස් කිරීම හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම ;

(ඈ) විශේෂ අධ්‍යාපන අවශ්‍යතාවයන් ඇති ළමුන්ගේ කටයුතුවල දී ඔවුන්ට සරිලන අධ්‍යාපන වැඩ සටහන් පිළියෙළ කිරීම හා ඔවුන්ගේ දැනුම කුසලතා වර්ධනයට අවශ්‍ය තීරණ ගැනීම ;

(ඉ) මෙම ප්‍රඥප්ති ප්‍රතිපාදනවලට පටහැනිව ක්‍රියාකරමින් සිටින පෙර පාසල් පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ගයන් ගැන තීරණය කිරීම ;

(ඊ) පෙර පාසල් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා පිළිබඳව සොයා බලා ඇමතිවරයාට නිර්දේශයන් ඉදිරිපත් කිරීම ;

(උ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව අදාළ බලධාරීන් වෙත උපදෙස් නිකුත් කිරීම ;

(ඌ) කලින් කලට අවශ්‍ය වන පරිදි ගුරු මග පෙන්වීම් පිළියෙළ කිරීම පිළිබඳව තීරණ ගැනීම ;

(එ) කලින් කලට ළමුන්ගේ ශාරීරික හා මානසික, පෝෂණ කටයුතු යනාදිය ගැන සැලකිල්ලට ගෙන ඒවා පිළියෙලකර වැඩි දියුණු කිරීම සඳහා වැඩ සටහන් ඇති කිරීම ;

(ඒ) පෙර පාසල් සම්පත් ප්‍රතිපාදනය පිළිබඳව තීරණ ගැනීම.

ඇමතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන කිසියම් කරුණක් පිළිබඳව තිරණ ගැනීම.

18. පෙර පාසල් විෂය නිර්දේශය උපදේශක කමිටුව විසින් පිළියෙළ කළ යුතු අතර, මෙම විෂය නිර්දේශය ඇමතිවරයා විසින් පිළිගත් එවැනි දිනක සිට පළාතේ සියලු පෙර පාසල්වල විෂය නිර්දේශය විය යුතුය. පෙර පාසල් විෂය නිර්දේශය

## IV කොටස

### පෙර පාසල් ඇගයීමට ලක් කිරීම

19. (අ) ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට මාස 3ක කාලය තුළ කාර්යාංශය නැගෙනහිර පළාත් පාසල් පිළිබඳ ඇගයීමක් සිදු කොට එම පදනමේ වාර්තාවක් ලේඛනගත කළ යුතු අතර එම ලේඛනයේ පහත සඳහන් කරුණු ඇතුළත් වී තිබිය යුතුය :- පෙර පාසල් පිළිබඳ ඇගයීම

(i) පළාත් මට්ටමින් දැනට ක්‍රියාත්මක වන පෙර පාසල් පිළිබඳ ලැයිස්තුව ;

(ii) එක් එක් පාසලේ සිටින ළමුන් සංඛ්‍යාව ;

(iii) එක් එක් පාසලේ තිබෙන පරිපාලන ක්‍රමය ;

(iv) එක් එක් පාසලේ සිටින ගුරුවරුන්ගේ සංඛ්‍යාව ;

(v) එක් එක් පාසලේ තිබෙන අනුමත සේවක සංඛ්‍යාව ;

(vi) එක් එක් පාසලට අයත් අධීක්ෂණ හා අනෙකුත් කළමනාකරණ ක්‍රමය ;

(vii) එක් එක් පාසලේ තිබෙන යටිතල පහසුකම් ;

(viii) එක් එක් පාසලේ පිහිටීම හා අනෙකුත් පරිසරය ;

(ix) එක් එක් පාසලේ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ආදායම් මූලාශ්‍ර ;

(x) ප්‍රදේශයේ මුළු ළමුන් සංඛ්‍යාවේ පෙර පාසල් අධ්‍යාපන ලබන ළමුන්ගේ ප්‍රතිශතය.

(ආ) කාර්යාංශය එවැනි ලේඛනය සකස් කිරීමේ දී පළාත් පාලන සභා, ආයතන හා අනෙකුත් අයගෙන් ලැබුණු එවැනි දත්තයන් හා අනෙකුත් තොරතුරු යෙදවුම් ලෙස ගත යුතුය.

(ඇ) පළාත් පාලන සභා, ආයතන හා අනෙකුත් අය එවැනි දත්තයන් හෝ තොරතුරු අදාළ පරිදි සභාපතිවරයාට ලබාදීම මෙයින් ඔවුන්ගේ රාජකාරිය විය යුතුය.

## *V කොටස*

### *නැගෙනහිර පළාත් පෙර පාසල් ප්‍රතිපත්තිය*

*පෙර පාසල් පළාත් ප්‍රතිපත්තිය හා කණ්ඩායම් පිහිටුවීම*

20. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට මාස 6 තුළ නැගෙනහිර පළාත් පෙර පාසල් ප්‍රතිපත්තියක් සූදානම් කළ යුතුය. (මින් මතුවට "ප්‍රතිපත්තිය" යනුවෙන් හැඳුන්වනු ලැබේ).

(2) මෙම ප්‍රතිපත්තිය සකස් කිරීම පිළිබඳව ඇමතිවරයා තුන්දෙනෙක් ඇතුළත් කණ්ඩායමක් පිහිටුවයි. මෙම කණ්ඩායමේ සාමාජිකයන් වශයෙන් ළමාවිය අධ්‍යාපන ක්‍රමයේ විශේෂ පළපුරුද්ද හා අනෙකුත් නිපුණතාවය ලැබූ දෙදෙනෙක් හා අනෙකුත් විෂයයන්ට සුදුසු තවත් කෙනෙක් ඇතුළත් කරනු ලබන අතර ප්‍රතිපත්තිය ඇමතිවරයා වෙත ඉදිරිපත් කළ එවැනි දිනක සිට ප්‍රතිපත්ති කණ්ඩායමේ නිල කාලය අවසන් කළ යුතුය.

(3) ප්‍රතිපත්ති කමිටුව විසින් පත්වීම් දිනයේ සිට මාස 06ක කාලය තුළ පහත සඳහන් කරුණු ඇතුළත් නැගෙනහිර පළාත් පෙර පාසල් ප්‍රතිපත්තියක් ඇමතිවරයාට ඉදිරිපත් කළ යුතුය.

(අ) පිළිගත් පෙර පාසල් අධ්‍යාපන නිර්ණායකයන් ස්ථිරව රඳවා තබා ගැනීමටත්, ඒවා පහසුවෙන් ළඟා කර ගැනීමටත් නැගෙනහිර පළාත් පෙර පාසල් මුහුණ දෙන අභියෝග හා අනෙකුත් අඩුපාඩු ;

(ආ) පළාතේ සියලු ප්‍රදේශවල ඇති ළමුන් පෙර පාසල් අධ්‍යාපනය ලබා ගැනීමේ දී දක්නට ලැබෙන අපහසුතාවයන් හා අනෙකුත් බාධාවන් ;

(ඇ) පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන පෙර පාසල් ක්‍රියාකාරී හැකියාවන් හා අනෙකුත් පෙන්නුම් කිරීමේ කුසලතාවයන් යනාදියේ දක්නට ලැබෙන ගැටුම් හා අනෙකුත් අඩුපාඩු ඉවත් කිරීම් හෝ අඩුකිරීම් පිළිබඳ යෝජනා ;

(ඈ) කලින් පිහිටවූ යටිතල පහසුකම් හා අනෙකුත් සම්පත් උපරිම ප්‍රයෝජනයට ගෙන ඒම, ක්‍රියාත්මක වන සම්පත් බෙදාහැරීම් ක්‍රියාපිළිවෙතේ සාධාරණත්වය අනුගමනය කිරීම පිළිබඳ යෝජනා ;

(ඉ) කලින් තිබුණු ගුරු සම්පත් කාර්යක්ෂමතා හා අනෙකුත් හැකියාවන් ඇතිව ගොඩනැගීම හා අතිරේක සම්පත් සම්බන්ධ කර ගැනීම ;

(ඊ) මෙම ප්‍රඥප්තියේ අරමුණු ළඟා කර ගැනීමේ දී අදාළ සුදුස්සන් හැඳුනාගැනීම හා සම්බන්ධ කර ගැනීම පිළිබඳ යෝජනා ;

(4) ඇමතිවරයා ප්‍රතිපත්ති කමිටු විසින් තමාට ඉදිරිපත් කළ අදාළ සැලසුම උපදේශ කමිටුව වෙත ඉදිරිපත් කර එම කමිටුවේ අදහස් හා නිර්දේශයන් ලබා ගත යුතුය ;

(5) ඇමතිවරයා විසින් උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කළ එවැනි අදහස් හා අනෙකුත් නිර්දේශයන් අවශ්‍ය පරිදි ප්‍රතිපත්තියට ඇතුළත් කර ඉන් අනතුරුව එය අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය ;

(6) අදාළ ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ තීරණය මත එය නැගෙනහිර පළාත් පෙර පාසල් ප්‍රතිපත්තිය යනුවෙන් ඇමතිවරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතුය.

## *VI කොටස*

### *පෙර පාසල් ලියාපදිංචි කිරීම*

21. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන එවැනි දිනට පසු පළාතේ ඇති එම පෙර පාසල් කාර්යාංශයේ ලියාපදිංචි නොකර ක්‍රියාත්මක කිරීම හෝ ස්ථාපනය කිරීම කළ නොහැක. *(ලියාපදිංචි නොකළ පෙර පාසල් ක්‍රියාත්මක නොකළ යුතුය යන්න)*

22. මෙම ප්‍රඥප්තිය ගැසට් මගින් ප්‍රසිද්ධ කර මාස 3ක් සම්පූර්ණ කිරීමට පෙර පළාත තුළ ක්‍රියාත්මක වන එක් එක් පෙර පාසල් හා එහි අයිතිකරුවන් හෝ පරිපාලකයින් මගින් මෙම ප්‍රඥප්තියේ පළමුවැනි ලේඛනයේ දක්වා ඇති ආකෘතියෙන් බලයලත් නිලධාරියා වෙත ඉල්ලුම් කළ හැක. *(පෙර පාසල් ලියාපදිංචි කිරීම)*

23. මෙම ප්‍රඥප්තිය ගැසට් පත්‍රයේ පළ කර මාස 3ක කාලය තුළ එවැනි ඉල්ලීම කිරීමට නොහැකි අයිතිකරුවන් හෝ පරිපාලකයින් ඉල්ලුම් කරන විට ප්‍රමාද වන කාලය සැලකීමට ගෙන බලයලත් නිලධාරියා දෙවැනි ලේඛනයේ විස්තර කරනු ලබන අතිරේක ගාස්තු අයකර ඉල්ලුම් පත්‍ර භාර ගත හැකි විය යුතුය. *(අදාළ කාලයේ ලියාපදිංචි නොකළ පාසල්වලට ප්‍රමාද ගාස්තු අය කිරීම)*

24 මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන එම දිනයෙන් පසු කිසියම් පෙර පාසලක්, ලියාපදිංචිය සඳහා යම් අයිතිකරුවෙක් හෝ පරිපාලකයෙක් බලයලත් නිලධාරියා වෙත ලේඛන 3හි දක්වන ඉල්ලුම් පත්‍රය මගින් ඉල්ලුම් කර ලියාපදිංචි කළ යුතුය. *(නව පෙර පාසල් ලියාපදිංචි කිරීම)*

25 එක් එක් ඉල්ලුම්කරුවන් කාර්යාංශය මගින් කලින් කලට තීරණය කරනු ලබන ලියාපදිංචි ගාස්තුව ලියාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රය සමඟ ගෙවිය යුතුය. *(ලියාපදිංචි ගාස්තුව)*

26 (1) කිසියම් අයිතිකරුවෙක් හෝ පරිපාලකයෙක් කිසියම් එක් පෙර පාසලක් හෝ ඊට වැඩි පාසල් මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදනවලට හෝ ඊට යටත්ව ඇතිකළ විධිවිධානවලට හෝ නියෝගවලට හෝ පටහැනිවීම. *(ප්‍රඥප්ති ප්‍රතිපාදන උල්ලංඝනය කිරීම එක් වරදකි)*

ආරම්භ කර හෝ ක්‍රියාත්මක කර හෝ යන බව බලයලත් නිලධාරියාට දැනගන්නට ලැබී ඔහු එවැනි අයිතිකරු හෝ පරිපාලකයන්ට එවැනි වැරද්දක් පිළිබඳව ලිඛිතව නියෝගයක් නිකුත් කර දින 14ක් සම්පූර්ණ වුවත් අදාළ වරද නිවැරදි කිරීමට එවැනි අයිතිකරු හෝ පරිපාලක අපොහොසත් වීම හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවේ එවැනි අයිතිකරු හෝ පරිපාලක මෙම ප්‍රඥප්තිය යටතේ වැරැද්දක් කළා යැයි සලකනු ලැබේ.

(2) කිසියම් පෙර පාසලක අයිතිකරු හෝ පරිපාලක උප වගන්තිය (1)හි යටතේ වැරදිකරුවෙකු ලෙස දකින්නට ලැබූ එවැනි දිනයේ සිට එක් එක් මාසය සඳහා රුපියල් 500කට නොවැඩි මුදලක් දඩ මුදලක් ලෙස කාර්යාංශයට ගෙවිය යුතු ය.

ලියාපදිංචිය කාර්යාංශයෙන් ප්‍රතික්ෂේප කළ හැක.

27. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන එවැනි දිනයේ පෙර පාසලක් මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදනවලට අනුව කාර්යාංශයේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කර එම ඉල්ලුම් පත්‍රය මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදනවලට අනුව නොතිබේ නම් එය පිළිබඳව හේතුන් දන්වා ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කළ හැක.

(2) එසේ ප්‍රතික්ෂේප කරනු ලබන එක් එක් ඉල්ලුම් පත්‍රය පිළිබඳවත් එය ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ හේතු ඉල්ලුම් කළ දිනයේ සිට එක් මාසයක් තුළ ඉල්ලුම්කරුට බලයලත් නිලධාරියා විසින් එවිය යුතු ය.

ඇමතිවරයාගේ අභියාචනය

(3) කිසියම් පෙර පාසලක අයිතිකරු හෝ පරිපාලක උපවගන්තිය (2) යටතේ ප්‍රතික්ෂේප නියෝගයකින් සෑහීමට පත්නොවන අවස්ථාවක එවැනි අයිතිකරු හෝ පරිපාලක සෑහීමට පත් නොවන තමාගේ හේතුව පෙන්වා අදාළ ප්‍රතික්ෂේප නියෝග ලැබී දින 14ක් තුළ ඇමතිවරයාට අභියාචනා කළ හැක.

(4) එවැනි අභියාචනය ලැබුණු විගස ඇමතිවරයා එවැනි අභියාචනය උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කර උපදේශක කමිටුවේ අවධානය හා නිර්දේශය මත අදාළ අභියාචනය පිළිබඳව ඇමතිවරයා තීරණයක් ගෙන එය ඉල්ලුම්කරු වෙත දැන්විය යුතු ය.

(5) අභියාචනය පිළිබඳව ඇමතිවරයා ගන්නා තීරණය අවසන් තීරණය විය යුතු ය.

පෙර පාසල් ලියාපදිංචි කිරීමේ ලේඛනය නඩත්තු කිරීම

28. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන එවැනි දිනක සිට පෙර පාසල් වශයෙන් ක්‍රියාත්මක වීමෙන් පසු මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනයෙන් පසු මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදනවලට අනුව අලුතින් ආරම්භ කර ලියාපදිංචි වූ පෙර පාසල් යනාදිය පිළිබඳ තොරතුරු ලියාපදිංචි කිරීමට ලේඛනයක් බලයලත් නිලධාරියා විසින් නඩත්තු කළ යුතු ය.

පෙර පාසල් ලියාපදිංචිය හා ලියාපදිංචි සහතිකය

(2) පළාතේ සියලු පෙර පාසල් කාර්යාංශය මගින් ලියාපදිංචි කළ යුතු අතර ඒ සඳහා ලියාපදිංචි අංකය හා ලියාපදිංචි සහතිකයක්ද බලයලත් නිලධාරියා විසින් ලබා දිය යුතු ය.

(3) සහතික පත්‍රය මෙම ප්‍රඥප්තියේ අවශ්‍යතාවයන් සඳහා වලංගු වන නෛතිකමය සහතිකයක් ලෙස සැලකිය යුතු ය.

## *VII* කොටස

*පෙර පාසල් ගුරුවරුන් හා ගුරුවරියන්ගේ සුදුසුකම් හා පුහුණු කිරීම්*

පෙර පාසල් ගුරුවරුන් හා ගුරුවරියන්ගේ අධ්‍යාපන සුදුසුකම්

29. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට පෙර පාසල් ගුරුවරුන්ගේ අවම අධ්‍යාපන සුදුසුකමක් ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අ. පො. ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙමළ හෝ සිංහල භාෂාව සමඟ ගණිතය ඇතුළත් විෂයයන් 6කින් සමත්වී තිබිය යුතු අතර උපදේශක කමිටුව විසින් පිළිගන්නා ලද කිසියම් ආයතනයක් පෙර පාසල් පිළිබඳව පවත්වන ලද මාස 3කට නොඅඩු පුහුණු පාඨමාලාව පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන එවැනි දිනයෙන් පසු ආරම්භ කර ක්‍රියාත්මක වන එවැනි පෙර පාසල් ගුරුවරුන් හා ගුරුවරියන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අ. පො. ස (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙමළ හෝ සිංහල භාෂාව සමඟ ගණිතය ඇතුළත්ව විෂයන් 5ක් සම්මාන ලබා තිබිය යුතු අතර අ. පො. ස (උසස් පෙළ) විභාගයේ සාමාර්ථය ඇතුළත් කිසියම් පිළිගත් අධ්‍යාපන ආයතනයක් විසින් පිරිනමන ලද පෙර පාසල් ගුරු පුහුණු ඩිප්ලෝමා සහතිකයට නොඅඩු සහතිකයක් ලබා තිබිය යුතු ය.

30. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන අවස්ථාවේ ක්‍රියාත්මක වෙමින් පවතින කිසියම් පෙර පාසලක් ගුරුවරුන් හා ගුරුවරියන් 29 වගන්තිය උප වගන්තිය (1)හි ප්‍රතිපාදනය කරන ලද සුදුසුකම් ලබා නොතිබීමේ දී මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට එක් අවුරුද්දක කාලය තුළ අදාළ සුදුසුකම් ලබා තිබිය යුතු ය. නුසුදුස්සන් අදාළ කාලයේ සුදුසුකම් ලබා තිබිය යුතුය.

31. 29 වැනි වගන්තියේ උප වගන්තිය (1) හි ප්‍රතිපාදනය කළ පරිදි මූලික අධ්‍යාපන සුදුසුකම් නොමැතිවත් 30 වගන්තියෙහි ප්‍රතිපාදනය කළ කාල සීමාව තුළ මූලික අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීමට නොහැකි එවැනි පෙර පාසල් ගුරුවරුන් හා ගුරුවරියන් වශයෙන් සේවය කරන එවැනි පුද්ගලයෙක් එවැනි තනතුරෙන් ඉවත්වන ලෙස නියෝග කිරීමට බලයලත් නිලධාරියාට බලය තිබිය යුතු ය. නුසුදුස්සන් ඉවත් කිරීමට නියෝග කිරීමේ බලතල.

32. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන එවැනි දිනයේ සිට මාස 6ක කාලය තුළ නැගෙනහිර පළාත තුළ ක්‍රියාත්මක වෙමින් පවතින පෙර පාසල් එවැනි ගුරුවරුන් හා ගුරුවරියන් මෙම ප්‍රඥප්තියේ 4 වැනි ලේඛනයේ දක්වා ඇති ඉල්ලුම් පත්‍රය මගින් කාර්යාංශයේ ලියාපදිංචි කළ යුතු ය. පෙර පාසල් පරිපාලකවරුන් විසින් ගුරුවරුන් හා ගුරුවරියන් ලියාපදිංචි කළ යුතුය.

(2) උප වගන්තිය (1)ට අනුව ඉල්ලුම් කර ඇති එවැනි ඉල්ලුම්කරුවන් මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදනවලට අනුකූලව සුදුසුකම් ලබා ඇත්නම් ඔවුන්ව බලයලත් නිලධාරියා විසින් ඒ සඳහා නඩත්තු කරන පොතේ එවැනි තොරතුරු ලියාපදිංචි කරන අතර ඔවුන් සඳහා ලියාපදිංචි අංකයක් ඔහු පිරිනමයි.

33. සභාපතිවරයා, පෙර පාසල පරිපාලනය කරන පරිපාලකවරුන්, ගුරුවරුන් හා ගුරුවරියන්ට අවශ්‍ය අතිරේක අධ්‍යාපනය හා දැනුම යනාදිය පිළිබඳව පුහුණු වැඩසටහනක් හා පුහුණු විෂය නිර්දේශයක් වාර්ෂිකව අදාළ වර්ෂයේ තුන්වැනි කාර්තුවට පෙර පිළියෙළ කොට උපදේශක කමිටුව වෙත අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කළ යුතුය. පරිපාලකවරුන් ගුරුවරුන් හා ගුරුවරියන්ගේ පුහුණුව.

34. උපදේශක කමිටුවේ අනුමැතිය මත බලයලත් නිලධාරියාගේ මගපෙන්වීම යටතේ පවත්වනු ලබන සුදුසු පාඨමාලාවලට සහභාගිවීම එක් එක් පෙර පාසල් පරිපාලකවරුන් ගුරුවරුන් හා ගුරුවරියන් යනාදි අයගේ අනිවාර්ය කටයුත්තක් විය යුතු අතර උපදේශක කමිටුව විසින් නිර්දේශ කරනු ලබන එවැනි අවශ්‍යතාවයන් ඇතුළත් සුදුසු පාඨමාලාවලට සහභාගි නොවන පරිපාලකවරුන් ගුරුවරුන් හා ගුරුවරියන් හට විරුද්ධව විනයානුකූල කටයුතු කිරීම බලයලත් නිලධාරියාගේ රාජකාරියක් විය යුතු ය.

35. පෙර පාසල් ළමුන්ගේ දෙමාපියන්ට උපදෙස් දී දැනුවත් කිරීම සඳහා උපදේශක කමිටුවේ නිර්දේශයන් මත ක්‍රමවත් වැඩසටහනක් බලයලත් නිලධාරියා විසින් සකස් කර ක්‍රියාත්මක කළ යුතු ය. දෙමාපියන් දැනුවත් කිරීම.

## *VIII කොටස*

### *පොදු ප්‍රතිපාදන*

36. (1) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපාදන මඟින් අවශ්‍ය වන එවැනි කාර්යයන් පිළිබඳව ඇමතිවරයාගේ නියෝගයන් හා අනෙකුත් විධිවිධාන සකස් කර ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමට හැකිවිය යුතු ය. විධිවිධාන හා අනෙකුත් නියෝගයන් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීම.

(2) ඇමතිවරයා විසින් ඇතිකරන සියලුම විධිවිධාන හා අනෙකුත් නියෝගයන් ගැසට් පත්‍රයේ පළ කර එවැනි දිනයේ සිට හෝ එම නියෝගය බලයට එන බව සඳහන් කරනු ලබන එවැනි දින සිට ක්‍රියාත්මක කළ යුතු ය. විධිවිධාන හා නියෝගයන් බලයට පැමිණීම.

කෙසේ වෙතත් එවැනි විධිවිධාන හා අනෙකුත් නියෝගයන් ගැසට් පත්‍රයේ පළ කර මාස තුනක කාලය තුළ අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු අතර එම කාලපරිච්ඡේදයේ පළාත් සභාව අත්හිටුවීම හෝ අහෝසි කිරීම හෝ සිදුවන්නේ නම් එවැනි අත්හිටුවීම හෝ අහෝසි කිරීම ඊලඟ පළාත් සභාවේ පළමු සැසිවාරයේ දී ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව එවැනි විධිවිධාන හෝ නියෝගයන්ට හෝ අනුමත නොකරන එවැනි

අවස්ථාවේ දී එය අනුමැතිය ප්‍රතික්ෂේප කළ එවැනි දිනයට ප්‍රථම අදාළ විධිවිධාන හෝ නියෝගයන් යටතේ ඉටුකරනු ලබන ක්‍රියාකාරකම්වලට කිසියම් අලාභයක් සිදුනොවන පරිදි බෙලහීන කළ බව සලකනු ලැබිය යුතු ය.

(3) කිසියම් විධිවිධාන හෝ නියෝග බෙලහීන කළ බව සැලකූ එවැනි දිනයේ දී ඒ පිළිබඳ *ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

විශේෂ සේවාවන්ට පුද්ගලයන් යෙදවීම හා දීමනා.

37. මෙම ප්‍රඥප්තිය මගින් ප්‍රතිපාදනය කර ඇති කාර්යයන් ඉටු කිරීමේ අරමුණින් කිසියම් පුද්ගලයකුගේ හෝ පුද්ගලයන්ගේ හෝ සේවා අදාළ කාල සීමාව තුළ කාර්යාංශයෙන් ලබා ගත හැකි විය යුතු අතර ඒ සඳහා වූ දීමනා ගෙවීමට හැකිවිය යුතු ය.

ඇමතිවරයාගේ උපදේශක කමිටු නියෝග පිළිගෙන බලයලත් නිලධාරියා ක්‍රියා කළ යුතු බව.

38. ඇමතිවරයා විසින් හෝ උපදේශක කමිටුව විසින් හෝ බලයලත් නිලධාරියා වෙත මෙම ප්‍රඥප්තියේ අවශ්‍යතාවයන්ට අනුව කිසියම් නියෝගයක් හෝ උපදෙසක් හෝ මගපෙන්වීමක් හෝ ලබා දුන්නොත් ඒ අනුව ඔහු ක්‍රියාත්මකවීමටත් කිසියම් වාර්තාවක් හෝ ලියවිල්ලක් ඇමතිවරයා විසින් හෝ උපදේශක කමිටුව විසින් හෝ ඉල්ලා සිටින්නේ නම් එය ලබාදීම බලයලත් නිලධාරියාගේ යුතුකමක් විය යුතු ය.

## *IX කොටස*

### *වැරදි හා දඬුවම්*

වැරදි හා දඬුවම්

39. මෙම ප්‍රඥප්තියේ එක් විධිවිධානයක් හෝ විවිධ හෝ ඒ යටතේ ඇති කරන ලද විධිවිධාන හා අනෙකුත් නියෝග උල්ලංඝණය කිරීම හෝ මෙම ප්‍රඥප්තිය මඟින් පමුණුවන යුතුකම් හෝ වගකීම් පිළිගෙන කටයුතු කිරීමට නොහැකිවීම හෝ මෙම ප්‍රඥප්තිය මඟින් බලයලත් කිසියම් කෙනෙකුට තමාගේ රාජකාරි ඉටුකිරීමේදී බාධා ඇති කිරීම, මෙම ප්‍රඥප්තිය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් විය යුතු ය.

40. එවැනි වරදක් සිදු කරන කිසියම් කෙනෙකුට මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ කෙටි ක්‍රම විභාගයකින් වරදකරුවෙකු බවට පත්කරනු ලැබුව හොත් එම පුද්ගලයාට ශ්‍රී ලංකා වලංගු මුදලින් රුපියල් දහසක් හෝ මාස 6කට නොවැඩි සිරදඬුවමක් හෝ මේ දෙකම දඬුවම් වශයෙන් නියම කළ හැක.

නොගැලපෙන තැන දෙමළ පාඨය බලපැවැත්විය යුතු බව.

41. මෙම ප්‍රඥප්තියේ සිංහල හෝ දෙමළ භාෂා අතර යම් වෙනසක් තිබේ නම් දෙමළ පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපනය.

42. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වූවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි,

"ඇමතිවරයා" යන්නෙන් නැගෙනහිර පළාතේ පළාත් පාලනය භාර ඇමතිවරයා ද,

"අමාත්‍ය මණ්ඩලය" යන්නෙන් නැගෙනහිර පළාත් අමාත්‍ය මණ්ඩලය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ වගන්ති 04 යටතේ පත්කරනු ලබන නිලධාරියා ද,

"පරිපාලකවරුන් " යන්නෙන් පෙර පාසල් පවත්වා ගෙන යන හෝ කළමනාකරණය කරන්නන් ද,

"පෙර පාසල" යන්නෙන් පළාත තුළ ළමාවියේ අධ්‍යාපන හා අනෙකුත් විශේෂ අධ්‍යාපනය ලබා දෙන අරමුණින් පිහිටුවා ක්‍රියාත්මක වන අධ්‍යාපන ආයතනයන් ද,

"ළමාවිය" යන්නෙන් ස්ත්‍රී හා පුරුෂ දෙපාර්ශවයේ වයස අවුරුදු 3 සිට 5 දක්වා වූ වයස් සීමාව ද,

"පළාත" යන්නෙන් මඩකලපුව ත්‍රිකුණාමලය හා අම්පාර යන පරිපාලන දිස්ත්‍රික්ක 3 ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 8 වැනි ලේඛනයේ සඳහන් කර ඇති නැගෙනහිර පළාත් භූමි ප්‍රදේශය ද,

"පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XV11A පරිච්ඡේදයට අනුව ස්ථාපිත කළ නැගෙනහිර පළාත් සභාව ද,

"පළාතේ පළාත් පාලන කොමසාරිස් " යන්නෙන් නැගෙනහිර පළාත සඳහා ස්ථාපනය කළ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා ද,

"පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව" යන්නෙන් නැගෙනහිර පළාත් සභාව සඳහා ස්ථාපනය කළ පළාත් පාලන දෙපාර්තමේන්තුව ද,

"විශේෂ ළමයෙක් " යන්නෙන් ළමාවියේ ශාරීරික හා මානසික වර්ධනයේ අඩු ළමයින් ද,

"විශේෂ අධ්‍යාපනය" යන්නෙන් විශේෂ ළමුන් කෙරෙහි ලබා දෙන අධ්‍යාපනය හා අනෙකුත් ඉගැන්වීම් කටයුතු ද,

"කාර්යාංශය" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ ස්ථාපනය කරනු ලබන නැගෙනහිර පළාත් පෙර පාසල් කාර්යාංශයද අදහස් වේ.

වගන්තිය 22ට
අනුව

පළමු ලේඛනය

**පෙර පාසල් කාර්යාංශය**
**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

1. ඉල්ලුම් පත්‍ර අංකය :-
2. ලැබුණු දිනය :-
3. භාරගත් නිලධාරියාගේ අත්සන :-
4. ගෙවන ලද ලියාපදිංචි ගාස්තු මුදල :-
5. ලැබීම් කුවිතාන්සි අංකය :-
6. ලියාපදිංචිය භාරගන්නා ලදී :-
   ලියාපදිංචිය භාර නොගන්නා ලදී :-
7. භාර නොගන්නේ නම් හේතුව :-
   කෙටියෙන් සඳහන් කරන්න :-
8. භාර ගෙන ඇත්නම් ලියාපදිංචි අංකය :-

………………………
සභාපතිවරයාගේ අත්සන

**ක්‍රියාත්මකව පවතින පෙර පාසල් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය**

1. පෙර පාසල් පිහිටුවා ක්‍රියාත්මක වන ස්ථානයේ නම හා ලිපිනය :-
2. ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංකය :-
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-
4. දිස්ත්‍රික්කය :-
5. පළාත් පාලන ආයතනයේ නම :-

6. කලාප අධ්‍යාපන කාර්යාල කොට්ඨාසය :-
7. ආරම්භ කළ දිනය :-
8. පෙර පාසලේ නම :-
9. පෙර පාසලේ උගන්වන භාෂාව :-
10. පෙර පාසලේ දැනට ක්‍රියාත්මක වන විෂය නිර්දේශයේ විස්තරය :-
(පිටපත් ඇමිණිය යුතුය)

11. පෙර පාසල් (අ) අයිතිකරුගේ නම :-
(ආ) පරිපාලකගේ නම/නම් :-

12. මීට පෙර කිසියම් ආයතනයක පෙර පාසල ලියාපදිංචි කර තිබේද? :-
එසේ නම් ඒ පිළිබඳ විස්තරය :-
13. පෙර පාසල් ස්ථාපනය කිරීමට හේතුවූ පුද්ගලයෙක්/පුද්ගලයන් හෝ ආයතනයේ නම :-
14. පෙර පාසලට මුදල් ලබා දෙන භාණ්ඩ ලබා දෙන පුද්ගලයකුගේ හෝ ආයතනයේ විස්තරය :-
15. පෙර පාසල පිහිටා ඇති ඉඩම, ගොඩනැගිලි අයිතිකරුගේ විස්තර :-
16. පෙර පාසල පිහිටා ඇති ගොඩනැගිල්ලේ කාමර හෝ ශාලාවේ විස්තර හා ඉඩ ප්‍රමාණය (සිතියම ඇමිණිය යුතුය ) :-
17. ඉඩම හා ගොඩනැගිල්ල කවුරු විසින් නඩත්තු කරනු ලබන්නේද පිළිබඳ විස්තර :-
18. දැනට ලියාපදිංචි කර ඇති සිසුන් සංඛ්‍යාව :-
පුරුෂ :-
ස්ත්‍රී :-

19. ගුරු විස්තරය :-
ගුරුවරයාගේ නම : ලිපිනය : පුරුෂ/ස්ත්‍රී : අධ්‍යාපන සුදුසුකම් :

20. පෙර පාසල් පරිපාලනය/කළමනාකරණය පිළිබඳ විස්තර :-
21. පෙර පාසල් සඳහා වූ මූලික පහසුකම් පිළිබඳ විස්තරය :-
පානීය ජලය :-
විදුලිය :-
වැසිකිලිය :-
ක්‍රීඩාංගනය/මිදුල :-
වෙනත් :-

22. පෙර පාසලට ලැබී ඇති/ලැබීමට ඇති අධ්‍යාපන හා ඉගැන්වීම් උපකරණ පිළිබඳ විස්තර :-

ඉහත සඳහන් විස්තර සත්‍ය බව මෙයින් සහතික කරමි.

දිනය :-

ඉල්ලුම්කරුගේ අත්සන :-
නම :-
තනතුර නිළය :-

23 වැනි වගන්තියට අනුව

දෙවැනි ලේඛනය

**ප්‍රමාද ගාස්තු**

1. පළමු මාස 3 ක ප්‍රමාදය සඳහා මසකට රුපියල් 500 බැගින්

2. ප්‍රමාද කාලය පළමු මාස 3 කට පසු එළඹෙන මාස 5 ක් සඳහා මසකට රුපියල් 1000 බැගින්

3. ප්‍රමාද කාලය මාස 3 කටත් ඉක්ම වූ විළඟට එළඹෙන ප්‍රමාද කාලය ඇතුළත් වන්නේ නම් ප්‍රමාද ගාස්තු ඉහත දක්වා ඇති (1) හා (2) හි සඳහන් ගාස්තු දෙකම එකතු වේ.

24 වැනි වගන්තියට අනුව

තුන්වැනි ලේඛනය

**මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කළ දිනයේ සිට ස්ථාපනය වන පාසල් සඳහා වේ.**

**පෙර පාසල් කාර්යාංශය**

1. ඉල්ලුම්පත්‍ර අංකය :-
2. ලැබුණු දිනය :-
3. භාරගත් නිලධාරියාගේ අත්සන :-
4. ගෙවන ලද ලියාපදිංචි ගාස්තු මුදල :-
5. ලැබීම් කුවිතාන්සි අංකය :-
6. ලියාපදිංචිය භාරගන්නා ලදී :-
   ලියා පදිංචිය භාර නොගන්නා ලදී :-
7. භාර නොගන්නේ නම් හේතුව :-
   කෙටියෙන් සඳහන් කරන්න :-
8. භාර ගෙන ඇත්නම් ලියාපදිංචි අංකය :-

……………………….
සභාපතිවරයාගේ/අත්සන

**අළුතෙන් ස්ථාපනය කරනු ලබන පෙර පාසල් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය**

1. පෙර පාසල නිර්මාණය කිරීමට හෝ ස්ථාපනය කිරීමට යෝජිත ඉඩමේ නම හා ලිපිනය :-
2. ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංකය :-
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-
4. දිස්ත්‍රික්කය :-
5. පළාත් පාලන ආයතන කොට්ඨාසය :-
6. කලාප අධ්‍යාපන කාර්යාල කොට්ඨාසය :-
7. පෙර පාසල සඳහා යෝජිත නම :-
8. පෙර පාසලේ උගන්වන භාෂාව/භාෂා :-
9. පෙර පාසල් (අ) අයිතිකරුගේ නම :-
   (ආ) පරිපාලකගේ නම/නම් :-
10. පෙර පාසල් ස්ථාපනය කිරීමට හේතු වූ පුද්ගලයෙක් පුද්ගලයන් හෝ ආයතනයේ විස්තරය :-
11. පෙර පාසල සඳහා මුල්‍ය හෝ ද්‍රව්‍ය යෝජිත පුද්ගලයකුගේ ආයතනයේ විස්තරය :-
12. කලින් පිහිටා තිබූ ගොඩනැඟිල්ල නම් යෝජිත පෙර පාසල ස්ථාපනය කිරීමට යෝජිත
    (අ) ඉඩම/ගොඩනැඟිල්ලේ අයිතිකරුගේ විස්තර :-
    (ආ) ගොඩනැඟිල්ලේ කාමරය/ශාලාව විස්තරය (සිතියම ඇමිණිය යුතුය) :-
13. අළුතෙන් ගොඩනැඟිලි නිර්මාණය කිරීමට යෝජිත නම්
    (අ) ඉඩමේ අයිතිකරුගේ විස්තරය :-
    (ආ) ගොඩනැඟිල්ල සඳහා මුදල් ලබා දෙන්නාගේ විස්තරය :-
    (ඇ) නිර්මාණය කරනු ලබන ගොඩනැඟිල්ල නඩත්තු විස්තරය :-
14. ලියාපදිංචි කිරීමට ඇති ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ යෝජිත සංඛ්‍යාව :-
    පුරුෂ :-
    ස්ත්‍රී :-

15. යෝජිත ගුරුවරුන්ගේ විස්තරය :-
    ගුරුවරයාගේ නම ලිපිනය පුරුෂ/ස්ත්‍රී අධ්‍යාපන සුදුසුකම්
16. යෝජිත පෙර පාසල කවුරුන් විසින් පරිපාලනය කිරීමට හෝ කළමනාකරණය කිරීමට පිළිබඳ විස්තර :-
17. පෙර පාසල සඳහා ඉදි කිරීමට ඇති යටිතල පහසුකම් පිළිබඳ විස්තරය :-
    පානීය ජලය :-
    විදුලිය :-
    වැසිකිලිය :-
    ක්‍රීඩාංගනය/මිදුල :-
    වෙනත් :-

18. පෙර පාසලට ලැබී ඇති / ලැබීමට ඇති අධ්‍යාපන හා ඉගැන්වීම් උපකරණ පිළිබඳ විස්තර :-

ඉහත සඳහන් විස්තර සත්‍ය බව මෙයින් සහතික කරමි.

දිනය :-

ඉල්ලුම්කරුගේ අත්සන :-
නම :-
තනතුර/නිළය :-

32 වැනි වගන්තියට අනුව

හතරවැනි ලේඛනය

**පෙර පාසල් ගුරුවරුන් හා ගුරුවරියන් ලියාපදිංචි කිරීම සඳහා වු ඉල්ලුම් පත්‍රය**

1. ගුරුවරයාගේ නම (මුල් අකුරු සමග) :-
2. මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :-
3. ජාතික හැඳුනුම්පත් අංකය :-
4. ලිපිනය :-
5. ලිපිනය පිහිටා ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාසය හා අංකය :-
6. විවාහක/අවිවාහක බව :-
7. ස්ත්‍රී/පුරුෂභාවය :-
8. උපන් දිනය :-
9. ඉල්ලුම් කරන දිනට වයස :- අවුරුදු :- මාස :- දින :-
10. ජාතිය :-
11. ආගම :-
12. ඉගැන්වීම් කටයුතුවල නිරතවන පෙර පාසලේ නම හා ලිපිනය :-
13. එය පිහිටා ඇති :-
    (අ) ග්‍රාම නිලධාරී කොට්ඨාසය අංකය :-
    (ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :-
    (ඇ) දිස්ත්‍රික්කය :-
    (ඇ) පළාත් පාලන ආයතනයේ නම :-

14. පෙර පාසලේ අයිතිකරු/පරිපාලකගේ නම :-
15. ඔබ උගන්වන මාධ්‍ය :-
16. ඔබ සමඟ එක් වී කටයුතු කරන කිසියම් ගුරුවරුන් සිටින්නෝ නම් ඔවුන්ගේ විස්තර :-
    නම : ලිපිනය :

17. ඉහත පාසලේ ඔබ ගුරුවරයකු වශයෙන් බැඳුණු දිනය :-
18. ඔබේ පෙර පාසලේ ගුරු සේවා විස්තර :-
    අනු අංකය : පාසලේ නම : ලිපිනය : ආරම්භය-දක්වා

19. ඉල්ලුම් කළ දිනයට ඔබගේ මුළු සේවා කාලය :-
20. අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර :-
21. වෘත්තිය සුදුසුකම් පිළිබඳ විස්තර :-
22. සහභාගි වූ සහතිකපත්‍ර ලබා ගත් පාඨමාලා වැඩමුළු හා අනෙකුත් සම්මන්ත්‍රණ පිළිබඳ විස්තර :-

| | විෂය | කාලය | කවුරුන් විසින් |
|---|---|---|---|
| පුහුණුව | | | |
| වැඩමුළුව | | | |
| සම්මන්ත්‍රණය | | | |

23. ඉල්ලුම් කළ දිනයට ඔබගේ වැටුප් හා අනෙකුත් දීමනා පිළිබඳ විස්තර :-
24. ඔබගේ වැටුප ගෙවනු ලබන ආදායම් මාර්ග :-

ඉහත මා විසින් ලබා දී ඇති විස්තර මාගේ දැනීමේ හැටියට නිවැරදි බවත්, අවංක බවත්, සත්‍ය බවත් මෙයින් ප්‍රකාශ කර සහතික කරමි.

………………… …………………
දිනය. ඉල්ලුම්කරුගේ අත්සන.

ඉහත ගුරුවරුන් / ගුරුවරියන් වන ……………………………..… මහතා/මෙනවිය/මිය ලබාදී ඇති තොරතුරු අපේ පාසැලේ ලිපි ලේඛන හා අනෙකුත් ලිපිගොනු අනුව නිවැරදි බව මෙයින් සහතික කර නිර්දේශ කරමි.

දිනය :-

අයිතිකරුගේ/පරිපාලකගේ අත්සන :-
නම :-
තනතුර/නිලය :-

04-283

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 - PG 001229